අහෝ ජනයිනි! මම මෙය නිර්මාණය කළේ නුඹලා මා පිළිපදිනු පිණිසය. මාගේ සලාතය නුඹලා හදාරනු පිණිසය

අබූ හාසිම් ඉබ්නු දීනාර් තුමා විසින් වාර්තා කරන ලදී. මිනිසුන් පිරිසක් සහ්ල් ඉබ්නු සඃද් අස්-සාඉදී තුමා වෙත පැමිණ මින්බරය (ධර්මාසනය) සම්බන්ධයෙන් එය කවර ලීයකින් තනා ඇත්දැයි කතා කරමින් සිටියෝය. පසුව ඒ ගැන ඔවුහු ඔහුගෙන් විමසුවෝය. එවිට ඔහු: "අල්ලාහ් මත දිවුරා පවසමි. සැබැවින්ම එය කවර දෙයකින් වූවක් දැයි මම දනිමි. එය තබන ලද මුල් දිනයේම මම එය දැක ඇත්තෙමි. එමෙන්ම අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ඒ මත අසුන් ගත් මුල් දිනය ද මම දැක ඇත්තෙමි." අල්ලාහ්ගේ දූතයාණෝ - අන්සාරී- කාන්තාවකට දූත පණිවිඩයක් එවූහ. "මම මිනිසුන් සමග කතා කරන විට ඒ මත වාඩි වන්නට මා වෙනුවෙන් ආසනයක් නිර්මාණය කර දෙන්නැයි ඔබ ඔබේ වඩු පුතාට පවසන්න" යැයි ඉල්ලා සිටියහ. පසුව ඇය ඔහුට නියෝග කොට ඔහු ද කැලෑවේ හැදෙන 'තර්ෆා' නම් ගස් වර්ගයකින් එය නිර්මාණය කොට ඇය වෙත ගෙන ආවේය. පසුව ඇය එය අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) වෙත පිළිගැන්වූවාය. පසුව එය තබන මෙන් ඇයට පැවසූ පසු ඇය එය මෙතැනින් තැබුවාය. පසුව අල්ලාහ්ගේ දූතයාණන් ඒ මත සලාත් ඉටු කරනු මම දුටුවෙමි.
ඔහු ඒ මතට වී තක්බීර් පවසා පසුව ඒ මත සිටම රුකූඋ ද කළහ. පසුව එයින් බැස ධර්මාසනය පාදය
අසල සුජූද් කර නැවත නැග ගත්හ. අවසන් කළ පසුව මිනිසුන් වෙත හැරී මෙසේ පැවසූහ: "අහෝ ජනයිනි! මම මෙය නිර්මාණය කළේ නුඹලා මා පිළිපදිනු පිණිසය. මාගේ සලාතය නුඹලා හදාරනු පිණිසය."
[صحيح] [متفق عليه]

අල්ලාහ්ගේ දූතයාණන් යොදා ගත් ධර්මාසනය කවර දෙයකින් නිර්මාණය කරනු ලැබුවේ දැයි මිනිසුන් පිරිසක් එක් සහාබිවරයකු වෙත පැමිණ විමසා සිටියෝය. ඒ සම්බන්ධයෙන් ඔවුහු එකිනෙකා වාද කළෝය. තර් ක කළෝය. පසුව සැබැවින්ම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණන් වඩු සේවකයින් හිමි අන්සාරි කාන්තාවක් වෙත දූතයකු යවා ඇයට මෙසේ නියෝග කර සිටියහ. 'මිනිසුන් සමග මා කතා කරන විට, වාඩිවන්නට ධර්මාසනයක් මා වෙනුවෙන් නිර්මාණය කර දෙන්නැයි ඔබේ දරුවාට ඔබ කියන්නැ'යි පවසා සිටියේය. එවිට එම කාන්තාව එයට ප්රතිචාර දක්වා නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ට අත්-තර්ෆා නම් ගසෙන් ධර්මාසනයක් තනා දෙන මෙන් නියෝග කළාය. ඔහු වැඩ අවසන් කළ කල්හි එය නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) වෙත එව්වාය. පසුව ඒ මස්ජිදයේ නියමිත ස්ථානයේ තබන මෙන් නියෝග කළහ. පසුව නබි (සල්ලල්ලාහු අලයිහි වස්ලම්) තුමාණන් ඒ මත සලාත් ඉටු කරන්නට වූහ. එතුමා ඒ මත සිට තක්බීර් පවසා ඒ මත සිටම රුකූඋ කළහ. පසුව පසුපස නොහැරී පසු පස්සට බැස ධර්මාසනය මුල සජදා ඉටු කොට නැවත නැග ගත්හ. සලාතය අවසන් වූ කල්හි මිනිසුන් ඉදිරියට හැරී, 'අහෝ ජනයිනි! සැබැවින්ම මා මෙය සිදු කළේ නුඹලා මා පිළිපදිනු පිණිස හා මාගේ සලාතය නුඹලා හදාරනු පිණිසය' යැයි පවසා සිටියහ.

http://www.sunnah.global/hadeeth/si/show/65096